**ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට වාර්ෂික විස්තරාත්මක කළමණාකරන වාර්ථාව 2021 ඔක්තෝබර් මස 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවටද ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 154(6) වාර්තාව 3.6 (ආ) | 2011නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි .මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් මෙහෙයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි .මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බවද තවදුරටත් නිරීක්ෂණය විය . | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි සහ 2016 ජූනි 24 දින පැවැත්වූ රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාර ලාභ උපයන ව්‍යාපෘති වල මෙහෙයුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණ කටයුතු විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට අදාලව අත්තිකාරම් ගෙවීම් වෙනස වූ රු. 126,425 ක අගය හා අත්තිකාරම් ලැබීම් වෙනස වූ රු.129,345 ක අගය අක්මුදල් ගැලපුම් ගිණුමට ගලපා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 6 -3 ඡේදය අනුව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ප්‍රකාශ පදනම් කරගෙන ආකෘති පත්‍ර භාණ්ඩාගාර ගිණුම් සමග ගලපා ගිණුම් ඉදිරිපත් කර ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 06 හි **(iv)** යටතේ නිශ්චිතව දක්වා ඇති උපදෙස් හා මගපෙන්වීම් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) තැන්පතු ගිණුම් වලට අදාලව ගෙවීම් යටතේ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අගය හා දෙපාර්තමේන්තු පොත්වල අගය අතර වෙනස වූ රු.15,527,400 ක් අක්මුදල් ගැලපුම් ගිණුමට ගලපා නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) 224 ශීර්ෂය යටතේ වියදම රු.39,360,340,597 ක් වූ අතර එය භාණ්ඩාගාර මුද්‍රිත අනුව රු.40,578,619,466 ක් විය. ඒ අනුව 224 ශීර්ෂය යටතේ වෙනත් දෙපාර්තමේන්තු, ආයතන විසින් වැය කරන ලද රු.1,218,278,868 ක්වූ වියදම් අක්මුදල් ගැලපුම් ගිණුමට ගලපා නොතිබුණි. | රු.1,218,278,869 ක් මගින් සෘජු හර කිරීම් නිරූපනය වේ. එම අගය අක්මුදල් ගැලපුම් ගිණුමේ හරස් සටහන් මගින් ගලපා ඇත. | -එම- |
| (ඈ) වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද වියදම රු.965,826,042 ක් අක්මුදල් ගැලපුම් ගිණුමේ රු.899,951,757 ක් ලෙස රු.65,874,305.93 ක් අඩුවෙන් ගලපා තිබුණි. | ගැලපුම් ගිණුමේ වෙනත් දෙපාර්තමේන්තු වියදම් ලෙස මුදලින් දරන වියදම් පමනක් ගලපා ඇත. | -එම- |

## 1.6.2 ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඒසීඒෆ් ආකෘතියට අදාලව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම් යටතේ දැක්වෙන වෙනත් ලැබීම් අගය රු.367,439,004 ක් වූ අතර එම අගය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත පිටපත් අනුව රු.1,277,948,568 ක් වූ බැවින් රු.910,509,564 කින් වෙනස්ව පැවතිණි. | මාර්ගෝපදේශ අංක 06 හි වෙනත් ලැබීම් සඳහා ඇතුලත් විය යුතු අයිතමයන් හෝ ගණනය කරන ආකාරය සඳහන්ව නොමැති බැවින් මුදල් පදනම මත වෙනත් ලැබීම් (හරස් සටහන් හැර) ඇතුලත්ව ඇත. | මූල්‍ය ප්‍රකාශන හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අගයන් අතර පවතින වෙනස්කම් විශ්ලේෂණය කර එකිනෙක ගැලපෙන අයුරින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කලයුතු වීම. |

## 1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලැබීම් දෙපාර්තමේන්තු පොත් අනුව රු.131,901,952 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු.132,031,297 ක් වූයෙන් වෙනස රු.129,345 ක් විය. තවද, අත්තිකාරම් ගෙවීම් දෙපාර්තමේන්තු පොත් අනුව රු.123,461,375 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු.123,587,798 ක් වූයෙන් වෙනස රු.126,423 ක් විය. | ඒසීඒ 5 ආකෘති පත්‍රයේ මුදලින් යන අගය තුල අත්තිකාරම් ගිණුම 011 ද හරස් සටහන් ලෙස 012 ද නිරූපණය කෙරේ. ලබාදී ඇති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06 හි 03 ඡේදය අනුව භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශ පදනම් කරගෙන ඒසීඒ 5 ආකෘති පත්‍ර භාණ්ඩාගාර ගිණුම් සමග ගලපා ගිණුම් ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අගයන් අතර පවතින වෙනස්කම් විශ්ලේෂණය කර එකිනෙක ගැලපෙන අයුරින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කලයුතු වීම. |
| (ආ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම සමග ඉදිරිපත් කර තිබුණ සිවිල් පුද්ගල ගිණුම් ලැයිස්තුවේ සඳහන් අගයන් සහ කටුනායක, දියතලාව, චීනවරාය සහ මොරවැව යන කඳවුරු විසින් එවා තිබුණු ණය ශේෂයන් අතර රු.2,241,464 ක වෙනස්කම් පැවතුණි. | අවසාන ගිණුම් තුලනය කිරීමේදී සිදුකරනු ලැබූ පරීක්ෂා කිරීම් වලදී අදාල නිවැරදි කිරීම් සිදුකරන ලදී. දැනට පවතින නිවැරදි ණය ශේෂ ලැයිස්තු අදාල කඳවුරු වෙත යොමු කර ඇත. | ණය ශේෂයන් පිළිබඳ විධිමත් අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපිත කර පවත්වා ගැනීම තුලින් නිවැරදි ණය ශේෂය පිළිබඳ යාවත්කාලීන දත්ත පවත්වා ගැනීමට කටයුතු කල යුතු වීම. |

**1.6.4 තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඒසීඒ 4 ආකෘති ප්‍රකාර පොදු තැන්පත් ගෙවීම් අගය පරිගණක මුද්‍රිත අනුව රු.409,428,340 ක් වූ අතර එය දෙපාර්තමේන්තු පොත් අනුව රු.393,900,939 ක් වූ බැවින් රු.15,527,401 ක වෙනසක් පැවතුණි. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අගයන් හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන අතර වෙනසක් නොමැති බව දක්වා ඇත. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අගයන් හා දෙපාර්තමේන්තු පොත් අගයන් අතර නොගැලපීම් විශ්ලේෂණය කර නිවැරදි කිරීමට කටයුතු කල යුතුවීම. |

**1.6.5 දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව මූලධන වියදම් වල ඇතුලත් මූලධන වත්කම් අත්පත් කර ගැනීම් එකතුව රු.1,898,013,532 ක් වුවද ඒසීඒ 6 ආකෘතිය ප්‍රකාර වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් හා අත්පත් කර ගැනීම්වල එකතුව රු.613,759,774 ක් විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවේ ශේෂයන් හා එම දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව නව ශේෂයන් ලෙස ඇතුලත් කිරීම් වූ රු.2,132,982,818 තුල වර්ෂයේ මිලදී ගැනීම් රු.1,284,253,758 අගයක් වීම.<br>රු.848,729,060 ක් වූ මාර්ගත ක්‍රමය යටතේ ඇතුලත් කිරීම් භාණ්ඩාගාර පරිගණක පද්ධතියේ නව මිලදී ගැනීම් ලෙස හඳුනා ගැනීම. | දේපල පිරියත හා උපකරණ අගයන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා මූල්‍ය ප්‍රකාශන සටහන් හා එකගවන අයුරින් පවත්වා ගතයුතු වීම. |

## 1.6.6 විගණන සාක්ෂි නොවීම

| නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 මාර්තු මස සිට ජූලි මාසය දක්වා ගුවන් හමුදා සුභ සාධක අරමුදල වෙත රු.4,075,530 ක් ප්‍රතිපූර්ණය කර තිබුණු අතර එයට අදාල සැපයුම්කරුගේ ඉන්වොයිස් පත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙවැනි විගණන නිරීක්ෂණ අනාගතයේදී ඇති නොවන පරිදි අදාල බිල්පත් ගෙවීම් වවුචර් සමග ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අංශ ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලද බව දන්වා ඇත. | විගණනයේ විෂය පථය සීමා නොවන ලෙස අවශ්‍ය මූලික ලිපිලේඛන විගණන අංශවලට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ආදායම් ශීර්ෂ 20-03-02-16 - ගුවන්යානා කුලී ආදායම් යටතේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂයන් 4 ක් තුල ආදායම් ඇස්තමේන්තු සියයට 33 සිට සියයට 80 ක පරාසයක අවකරණය කර සංශෝධනය කර තිබුණි. තවද , 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 24 සිට සියයට 89 දක්වා වූ පරාසයක ආදායම් ඉපයීම් අහිතකර අවකරණයකින් යුතුව විචලනය වී පැවතුනි. | • වාණිජ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අදාලව භාවිතයට ගත හැකි ගුවන් යානා සීමිත වීම.<br>• නීතිමය ගැටලු මත අනපේක්ෂිත ලෙස අභ්‍යන්තර ගුවන් සේවය තාවකාලිකව නවතා දැමීම<br>• අඩු පිරිවැයකින් පෞද්ගලික ගුවන් සේවා සපයන ආයතන බිහිවීම<br>• 2020 සිට පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය<br>• ඉදිරියේදී හැකිතාක් තාත්වික හා නිවැරදි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කරන බව යනාදී හේතු ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි 85 (1) (ඇ) ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාත් තාත්වික සහ නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කල යුතු වීම හා එම ආදායම් අයකර ගැනීමට කාලීන හා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 128 (2) ඉ ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතු ව තිබෙන හිග ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වේ. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන 10 ක් හා පෞද්ගලික ආයතන 02 කින් වර්ෂ 02 සිට වර්ෂ 17 දක්වා වූ කාල පරාසයක එකතුව රු.12,674,073 ක් වූ හිඟ ගුවන්යානා කුලී ආදායම් පැවතිණි. | නැවත මෙලෙස හිගහිටීම් ඇති නොවන ආකාරයකට අභ්‍යාන්තර පාලන පද්ධතියක් සකස් කොට ක්‍රියාත්මක කර ඇත | -එම- |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයහාර වැය විෂයයන් 22 ක සියයට 10 සිට සියයට 82 ක් දක්වා වූ පරාසයක රු.1,136,078,861 ක ඉතිරිවීම් පැවති අතර ප්‍රාග්ධන වැය විෂයයන් 18 ක සියයට 13 සිට සියයට 99 ක් දක්වා වූ පරාසයක රු. 2,133,683,282 **ක** ඉතිරිවීම් පැවතිණි. | මෙම වසරේ අතුරු සම්මත ගිණුම මගින් ප්‍රතිපාදන සැලසීමේදී ලැබී තිබුණු උපදෙස් වලට අනුව පළමු මාස 04 කාලයට පමණක් සැලසුම් සකස් කරන ලදී. මෙලෙස කටයුතු කිරීමේදී ගැටලුකාරී තත්ත්වයන් මතුවී තිබුණි. විශේෂයෙන් ගුවන් හමුදාවේ බොහොමයක් මිලදී ගැනීම් සිදුකරන්නේ විදේශ වෙළඳපොළ හරහාය. එහිදී ඇතිවන ගැටලුද මේ සඳහා බලපා ඇත. | ඇස්තමේන්තු ප්‍රතිපාදන හැකිතාක් අපේක්ෂිත අරමුණු ඉටුවන අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වැය ශීර්ෂ 08 යටතේ වැය විෂයයන් 11 ක් මගින් වෙනත් දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ වෙනුවෙන් වියදම් දැරීම සඳහා රු.1,042,464,388 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර ඉන් රු.76,638,327 ක ප්‍රතිපාදන ඉතිරිවී පැවතිණි. ඉන් වැය විෂය අංක 232-02-01-00-2002 යටතේ ලද රු.929,300 ක්වූ මුළු ප්‍රතිපාදන මුදල සමාලෝචිත වර්ෂය අවසානයට වැය නොකර ඉතිරි වී පැවතුණි. | 232-01-1-2002<br>2020 ඔක්තෝබර් ප්‍රතිපාදන ලැබීම හා ප්‍රසම්පාදන කටයුතු අවසන් කල නොහැකි වීම.<br>253-01-2-0-1501<br>2019 වර්ෂය විශ්‍රාම වැටුප් හිමි සේවා පුද්ගලයින් මිය යාම හේතු වීම<br><br>403-2-6-3-2104 - ප්‍රතිපාදන ලබාදුන් දින අනුව ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ නොහැකි බව<br>436-02-3-1-1501<br>කොරෝනා වසංගත තත්ත්වය<br>103-01-2-1-1501<br>රණවිරු මාපියන් දීමනා ඇතුලු දෙමාපියන් මියයාම, සේවා පුද්ගලයින් රණවිරුවන් සේවය අවසන් කිරීම<br>103-02-12-27-2509<br>කොරෝනා ප්‍රසම්පාදන කටයුතු සැලසුම් අනුව සිදු නොවීම යනාදී හේතු ඉදිරිපත් කර තිබුණි | ඇස්තමේන්තු ප්‍රතිපාදන හැකිතාක් අපේක්ෂිත අරමුණු ඉටුවන අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය | කාර්තුමය විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම, අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සමාලෝචනය කිරීම, විගණන වියදම් සේවා නඩත්තුව, අභ්‍යන්තර විගණනය සිදු කිරීම හා අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කිරීම, කාර්තු වශයෙන් අභ්‍යන්තර විගණන වාර්තා ඇගයීම් වාර්තා ඉදිරිපත් කිරීම, මු.රෙ. 135-139 ප්‍රකාර බලතල බෙදීම<br>සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පවත්වා සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර විගණකාධිපති | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වෙත ඉදිරිපත් කිරීම යන කටයුතු සිදු කර ඇත. | |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මියගිය සිවිල් නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.596,942 ක ණය ශේෂයන්, විශ්‍රාම ගිය සිවිල් නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.514,035 ණය ශේෂයන් හා සේවය හැර ගිය සිවිල් නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.7,568,745 ක ණය ශේෂයන් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවතුණි. | (i)මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ට අදාලව නිරවුල් නොවූ ණය ශේෂ පිළිබද සිවිල් පරිපාලන අධ්‍යාක්ෂක දැනුවත් කර ඇත.<br>(ii)කොරෝනා වසංගතය හමුවේ ණය අයකිරීම් ක්‍රියාවලිය පසුබෑමකට ලක්ව ඇත.<br>(iii)මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ට අදාල පැරණි ලියකියවිලි ආශ්‍රයෙන් ලේඛණ මගින් තොරතුරු ලබා ගනිමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඒවා ඉදිරිපත් කරමින් ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින අතර පාරිතෝෂිතයෙන් අය නොවූ ණය ශේෂ මාසික විශ්‍රාම වැටුපෙන් වාරික වශයෙන් අයකරමින් පවතී.<br>(iv)සේවය අත්හැර ගිය නිලධාරීන්ගේ තොරතුරු ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී මගින් නිවෙස් වෙත භාරදී ඇති අතර ඒවා අයකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂයන් කඩිනමින් අයකරගත ගැනීමට කාරයක්ෂමව හා ඵලදායී ක්‍රමවේදයන් සකස් කර ණය තොරතුරු යාවත්කාලීන කල යුතු වීම. |
| (ආ) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.1 වගන්තියේ සදහන් පරිදි සේවය හැර ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන | -එම- | -එම- |

විට විශ්‍රාමික හා මියගිය නිලධාරීන්ගෙන් හා සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය මුදල් පිළිවෙලින් රු.5,291,449 ක් හා රු.11,359,775 ක් විය. ඉන් වර්ෂ 05 ට වැඩි අයවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.1,110,887 හා රු.8,382,641 විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගුවන් හමුදාවට අවශ්‍ය මෙට්ට 1000 ක් මිලදී ගැනීම සඳහා රු.4,199,076 ක් තෝරාගත් ලංසුකරු හට ගෙවා තිබුණි. එහිදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.12 අනුව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු අතර ඒ වෙනුවට ලංසු සුරක්ෂණ ප්‍රකාශයක් ලංසු විවෘත කිරීමෙන් දින 13 කට පසු ලබාදී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කරන අවස්ථාවේදී ප්‍රතික්ෂේප කල යුතු වුවද එම ලංසුකරුටම ප්‍රසම්පාදනය පිරිනැමීමට කටයුතු කර තිබුණි. | අදාල ලංසුකරු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ රාජ්‍ය නොවන අරමුදලක් ලෙස ස්ථාපිත කර ඇත. එමෙන්ම දෙපාර්තමේන්තු මිලදී ගැනීමේ කමිටු අනුමැතියකින් සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි කර ඇත. ලංසු සුරක්ෂණ ඉදිරිපත් නොකලද ඒ වෙනුවට ලංසු සුරක්ෂණ ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. මෙම ව්‍යාපෘතියේ ධාරිතාව, මෙට්ටවල ගුණාත්මක බව සහ අවම ලංසුව සලකාබලා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ටෙන්ඩරය පිරිනමා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති විධිවිධාන වලට අනුගත වී ප්‍රසම්පාදන කටයුතු ඉටුකිරීම සිදුකල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වර්ෂ 2004 සිට 2014 දක්වා කාලය තුල අළුත්වැඩියාව සඳහා ගුවන්යානා කොටස් 72 ක් විදේශයන් වෙත යවා තිබුණු අතර එම ගුවන්යානා කොටස් වර්ෂ 6 සිට වර්ෂ 16 ක කාලපරාසය තුල නැවත ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි. | 2004-2019 දක්වා කාලයට අදාල විදේශ යවන ලද ගුවන් යානා අමතර කොටස් සඳහා පරීක්ෂණ අධිකරණයක් පත්කර පරීක්ෂණ විභාග වෙමින් පැවතීම. ගුවන් හමුදා මූලස්ථාන අධීක්ෂණය යටතේ පැවතීම හා 2016-2019 දක්වා ගුවන් යානා කොටස් වර්තමානයේ විදේශයන් වල නඩත්තු කටයුතු සිදු කරමින් පැවතීම යනාදී හේතුන් ඉදිරිපත් කර ඇත. | විදේශයන් වෙත යවන ලද වත්කම් වල අධීක්ෂණය නිසි පරිදි පවත්වාගැනීම හා එම වත්කම් යථා පරිදි නැවත ලබා ගැනීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගුවන් හමුදාව සතු වර්ග අඩි 49,999 ක් වූ ගොඩනැගිලි 29 ක් 2010 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් මස විගණන දින වන විටත් නිෂ්කාර්යව පැවතුනි. | මෙම ගොඩනැගිලි අළුත්වැඩියා කරමින් පවතින බවත් නුසුදුසු ගොඩනැගිලි කඩා ඉවත් කිරීමද ඉදිරියේදී සිදුකරන බව දන්වා ඇත. | භාවිතයට ගත හැකි ගොඩනැගිලි අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම හා ගුවන් හමුදාවට අයත් සියළුම ගොඩනැගිලි වල ප්‍රශස්ථ භාවිතය තහවුරු කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) | ගුවන් හමුදාව විසින් භාවිතා කරන හමුදා කඳවුරු 02 ක් හා හමුදා රෙජිමේන්තු පුහුණු පාසල පිහිටි ඉඩම් වල අයිතිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පවරා ගැනීමේ කටයුතු නිම වී නොතිබුණි. | කඳවුරු පිහිටි ඉඩම්වල අයිතිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුවන අතර වාර්ෂිකව බලපත්‍ර මගින් කඳවුරු පවත්වා ගෙන යයි. අදාල ඉඩම් පවරා දෙන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කොට ඇත. | හමුදාව විසින් භාවිතා කරන ගොඩනැගිලි වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කල යුතු වීම. |

**3.3** **පාඩු හා හානි**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **----------------------** | **--------------------------------** | **-----------** |
| (අ) මුදල් රෙගුලාසි 101 (2), 105 (2) (ආ) ප්‍රකාරව හා ත්‍රිවිධ සන්නද්ධ හමුදාවල හානිවීම් පිළිබද සකස් කල විශේෂ නීති සටහනේ 07 ප්‍රකාරව හානි පාඩු සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාකිරීම හා අයකිරීමට කටයුතු කල යුතු වේ. එහෙත් මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල සටහන් අනුව එකතුව රු.970,821,082 ක්වූ හානි පාඩු සිද්ධීන් 287 ක් පැවති අතර එයින් රු.15,935,809 ක් වූ සිද්ධි 26 ක් වර්ෂ 10 කට වැඩි ඒවා විය. තවත් රු.119,015,015ක්වූ සිද්ධි 21 ක් වර්ෂ 05 ක් 10 ත් අතර සිදුවූ හානි විය. එමෙන්ම වර්ෂ 5 ට අඩු එකතුව රු.835,870,258 ක් වූ සිද්ධි 240 ක් පැවතිණි. | • හානි සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයින්ගෙන් මුදල් මාසිකව අයකිරීමේදී කාල ප්‍රමාද වීම.<br>• හානි සම්බන්ධ වගකිව යුතු පාර්ශ සේවය හැර ගොස් ඇති විට අදාල මුදල් ඔවුන්ගෙන් අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සිදු වීම.<br>• හානි සම්බන්ධ නඩු පැවරීමේදී නඩු අවසන් වන තෙක් අයවීම් කාල ප්‍රමාදය<br>• හානි සම්බන්ධ පොලිස් අපරාද පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැනි ආයතන වල සිදුවන විමර්ශන කල් යාම ආදි හේතු මත අයවීම් ප්‍රමාද වීම, යනාදිය දක්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධයෙන් හානියේ වටිනාකම කඩිනමින් තක්සේරු කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 104 (4) හා ත්‍රිවිධ සන්නද්ධ හමුදාවල හානිවීම් පිළිබද සකස් කල විශේෂ නීති සටහන් ප්‍රකාර අලාභ හානියක් සිදුවූ දින සිට මාස 03 ක් ඇතුලත හානියේ වටිනාකම ගණනය කර පූර්ණ වාර්තා ඉදිරිපත් කල යුතු වේ. එහෙත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයේ හානි හා පාඩු පිළිබද ප්‍රකාශයේ සටහන් (i) හි ඇතුලත් 2019/2020 වර්ෂයන්ට අදාලව සිදුවූ හානි පාඩු සිද්ධීන් 9 ක් වර්ෂ 1 සිට මාස 6 ක් වූ කාල පරාසයක් තුල හානි වටිනාකම ගණනය කර නොතිබුණි. | දේපල වලට සිදුවූ හානි රක්ෂණාවරණයෙන් ආවරණය කරගෙන ඇති බැවින් හානියක් සිදුවී නොමැති වීම හා 2020 වර්ෂයේ හානි පිළිබද ප්‍රකාශය ඉදිරිපත් කරන අවස්ථාව වන විට හානිය ගණනය කිරීමට නොහැකි වීම යනාදි හේතු ඉදිරිපත් කර ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 මැයි 25 දින සිදු වූ Bell -206 (SHT 551) දරන හෙලිකොප්ටර් යානය ගුවන්ගත කිරීමට යාමේදී අනතුරට පත්වීම නිසා සිදු වූ රු.113,150,000 ක්වූ හානිය මු.රෙ.109 යටතේ පොතෙන් කපා හැරීමට 2020 ජූනි 03 දින භාණ්ඩාගාරයේ ලේකම් ගේ අනුමැතිය ලැබී ඇතත් එය සමාලෝචිත වර්ෂයේදී කපා හැර නොතිබුණි. | පොත් වලින් කපා හැරීම අනුමැතිය 2020 ජූනි 26 දින උපකරණ ප්‍රතිපාදන හා ගිණුම් කිරීමේ ඒකක හා සැපයුම් අධ්‍යක්ෂක වෙත යොමු කර ඇති අතර කපා හැරීම් කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොතෙන් කපා හැරීමේ නියෝගය අනුව හානිය/පාඩුව ඉවත් කිරීමට කඩිනමින් ක්‍රියාකල යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------ | ----------- |
| සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරීලත් නිලධාරීන් අනුමත සංඛ්‍යාව 2545 ක් වූ අතර ඉන් පුරප්පාඩු 488 ක් පැවතුණි. අධිකාරි නොලත් (සෙසු නිලයන්) නිලධාරීන් අනුමත සංඛ්‍යාව 34,344 ක්වූ අතර ඉන් පුරප්පාඩු 2953 ක් විය. සෙසු නිලයන්ගේ වැඩිම පුරප්පාඩු සංඛ්‍යාවක් එනම් පුරප්පාඩු 1956 ක් නායක ගුවන්භට හා ගුවන්භට තනතුරු සඳහා විය. | මුළු පුරප්පාඩු වලින් පුරප්පාඩු 478 ක් සම්පූර්ණ කර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට උපකාරී වන ප්‍රශස්ථ සේවක මණ්ඩලය පවත්වා ගැනීම. |